**31-01-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ මෙහි පැමිණ ඇත්තේ සියලු බලැති පියාගෙන් බලය ලබා ගැනීමටයි. එනම්, ඔය පහන් පැමිණ ඇත්තේ ඔබට ඥානය නමැති තෙල දමා ගැනීමටයි.

**ප්‍රශ්නය:** 'ශිව පෙරහැර' වෙත ප්‍රසාදයක් ඇත්තේ ඇයි?

**පිළිතුර:** ඒ ශිව බාබා ආපසු යන විට මුළු ජීවාත්ම සත්ථාවන් කැළම ඔහු පසුපස දුව යන නිසයි. උත්තරීතර කලාපයේදී ජීවාත්ම සත්ථාවන් සිටින්නේ මී වදයක මෙන් වූ ආකාරයෙනි. ඔබ දරුවන් පාරිශුද්ධියට පත් වී පියා සමඟ ආපසු යති. පෙරහැර පිළිබඳ ප්‍රසාදය ඇත්තේ ඔහුගේ සහභාගීත්වය නිසාය.

ඕම් ශාන්ති. ඔබ දරුවන් සියල්ලට පළමු තේරුම් ගත යුතු එක කරුණක් ඇත. එනම්, අප සියලු දෙනා සහෝදරයින් බවත් ඔහු අප සැමගේ පියා බවත්ය. ඔබට සියලු බල තිබුණු අතර මුළු ලොව පාලකයෝ විය. භාරතය දෙවි දේවතාවුන්ගේ රජදහන විය. එනම්, ඔබ දරුවන්ගේ රාජධානියයි. ඔබ පාරිශුද්ධ දේවි දේවතාවන් විය. එය ඔබේ කුලය හෝ වංශය විය. ඔවුන් සැම පාප රහිත වූහ. එසේ වූයේ කවුද? ජීවාත්ම සත්තාවන් පාරිශුද්ධ විය. පාප රහිත විය. ඔබ නැවතත් එසේ පාප රහිත බවට පත් වෙමින් සිටී. එය හරියටම ඔබ සියලු බලැති පියා සිහිකරමින් ඔහුගෙන් බලය ලබා ගන්නවා සේය. ඔබ ජීවාත්ම සත්තාවන් උපත් 84 ක චරිත කොටස් රඟපාන ආකාරය පියා පැහැදිලි කර ඇත. ඔබ වෙත තිබූ සතෝප්‍රධාන් බලය දිනෙන් දින දිගටම අඩු වී ගියේය. බැටරියේ බලය අඩු වූ විට කාරයක් නවතින්නා සේ ඔබ සතෝප්‍රධාන් බවින් තමෝප්‍රධාන් බවට පත් විය. බැටරිය බැස ගියේය. ජීවාත්ම සත්තාවක බැටරිය කෙසේවත් සම්පූර්ණයෙන් බැස නොයයි. සුළු බලයක් සැමවිට ඉතිරි වේ. කෙනෙක් මළ විට මැටි පහනක් දල්වයි. එය නොනිමී තිබීමට දිගටම තෙල් වක්කරයි. බැටරියක් බැස්ස විට එය නැවත ආරෝපණය කරයි. ඔබ දරුවන් දැන් දන්නවා ඔබ සියලු බල අධිකාරයෙන් යුතුව සිටි බව. ඔබේ බලය අඩු වී ඇති නිසි ඔබ නැවත බුද්ධිය මඟින් සියලු බල අධිකාරිය ඇති පියා සමඟ එක් වූ විට ඔහුගේ සියලු බල ඔබට ඇතුළු වේ. සුළු බලයක් නියතයෙන්ම ඉතිරිව තිබේ. එය සම්පූර්ණයෙන්ම අහවර වී නම් ශරීරය පවතින්නේ නැත. ජීවාත්ම සත්තාව සම්පූර්ණයෙන්ම පාරිශුද්ධියට පත් වන්නේ පරමාත්ම පියා සිහිකිරීම මඟිනි. සත් යුගයේ දී ඔබගේ බැටරිය සම්පූර්ණයෙන්ම ආරෝපණය වී ඇති අතර ඉන්පසුව ටිකෙන් ටික එය අඩු වී යයි. මීටරය ත්‍රේත යුගය වෙත සෙමෙන් බැස යයි. එයට කලා යනුවෙන් ද කියැවේ. එවිට ජීවාත්ම සත්තාව සතෝප්‍රධාන්ව සිටී. සතෝ තත්ත්වයට පත් වුණා යැයි කියයි, ශක්තිය හීන වේ. ඔබ දන්නවා සත් යුගයේ දී ඔබ මනුෂ්‍යා බවින් දෙවි දේවතා බවට පත් වූ බව. පරම පියා මෙසේ කියයි දැන් මා සිහිකළ විට ඔබ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් බවට පත් වේ. ඔබ දැන් තමෝප්‍රධාන් බවට පත් වී ශක්තිය බංකොලොත් බවට පත් වී ඇත. දැන් නැවතත් පියා සිහිකිරීමෙන්, ඔබට මුළු ශක්තිය ලැබේ. ඔබ දන්නවා, ඔබේ ශරීරය හා ශරීරයට සම්බන්ධ සියල්ල අවසන් වන බව. එවිට ඔබට අසීමිත රජදහන ලැබේ. පියා අසීමිත වන අතර ඔබට දෙන්නේ ද අසීමිත උරුමයකි. දැන් ඔබ අපිරිසිඳු අතර ඇත්තේ සුළු ශක්තියකි. ඕ දරුවනි දැන් මා සිහිකරන්න! මම සියලු බල ඇත්තා වෙමි. ඔබට සර්ව බලැති රජ දහන හිමිවන්නේ මා වෙතිනි. සත් යුගයේ දී, දෙවි දේවතාවුන් මුළු ලොව හිමිකරුවෝ වූහ. ඔවුන් පාරිශුද්ධ වූ අතර දිව්‍යමය ගුණාංග තිබුණි. ඔවුන්ට තව දුරටත් එම දිව්‍යමය ගුණාංග නැත. සැමගේම බැටරිය දැන් සම්පූර්ණයෙන්ම වාගේ බැස ගොස් ඇත. හැමගේම බැටරිය දැන් ආරෝපණය වෙමින් තිබේ. කිසිවෙකුගේ බැටරිය උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්ම සත්තාව සමඟ යෝගාවෙන් එක් නොවී ආරෝපණය නොවේ. එම පියා සදා පාරිශුද්ධය. මෙහි, සැම දෙනාම අපිරිසිඳුයි. ඔබ පිරිසිඳු වූ විට බැටරිය දිගටම වැඩකරයි. දැන් පියා මෙසේ විස්තර කරයි එකම කෙනා වන මා සිහිකරන්න! ඉහළම ඉහළ කෙනා පරමාත්ම දෙවියන් වන අතර අන් සැම නිර්මාණයට අයිතියි. නිර්මාණයකට කෙලෙසකවත් නිර්මාණයකින් කිසිවක්ම ලැබිය නොහැකියි. ඇත්තේ එකම එක නිර්මාපකයා පමණි. ඒ අසීමිත පියාය. අන් සියලු පියවරු සීමිතය. අසීමිත පියා සිහිකිරීමෙන් ඔබ අසීමිත ස්වාධිපත්‍ය ලබයි. ඒ නිසා, ඔබ දරුවන් හදවතින්ම දත යුතුයි බාබා ඔබ සඳහා නව ලෝකය වන දෙව්ලොව ස්ථාපනය කරන බව. එය ස්ථාපනය වන්නේ නාටක සැලසුම අනුවය. ඔබ දන්නවා සත්යුගය එන බව. සත් යුගයේ දී නිරන්තර සතුට ඇත. ඔබ එය ලබන්නේ කෙසේද? පරම පියා මෙහිදී එය විස්තර කරයි. ඔහු මෙසේ කියයි නිරතුරුවම මා පමණක්ම සිහිකරන්න. මා සදා පාරිශුද්ධය. මා කිසි විටෙක මනුෂ්‍යා ශරීරයක් නොගනී. මම දෙවියකුගේ හෝ මනුෂ්‍යයෙකුගේ ශරීරයක් නොගනිමි. එනම්,

මම උපත හා මරණය චක්‍රයට ඇතුළු නොවේ. මම සරළ ලෙසම මොහුගේ ශරීරයට, අවුරුදු 60 පිරෙන විශ්‍රාම කාලයේ දී ඔබ දරුවන්ට දිව්‍යලෝකයේ ආධිපත්‍ය ලබා දීම සඳහා ඇතුළු වෙමි. සම්පූර්ණ සතෝප්‍රධාන් තත්ත්වයේ සිට තමෝප්‍රධාන් වන්නේ මොහුය. අංක එක ඉහළම ඉහළ පරමාත්ම දෙවියන් වන අතර, ඔබට දර්ශන වලින් දැකිය හැකි සූක්ෂම කලාපයේ අය වන බ්‍රහ්ම, විශ්ණු සහ ශංකර් ඊළඟට කියැවේ. සූක්ෂම කලාපය යනු කිසිඳු භෞතික ශරීරයක් තිබිය නොහැකි මධ්‍යම කලාපයයි. සූක්ෂම ශරීර දිව්‍යමය දැක්මකින් දකිනවා පමණි. මෙහි ඇත්තේ මනුෂ්‍ය ලෝකයයි. කොහොමනමුත්, එම සුර ධූතයෝ ඉන්නේ දර්ශන වෙනුවෙන් පමණි. අවසානයේ දී ඔබ දරුවන් සම්පූර්ණ පාරිශුද්ධිය ලබන විට, ඔබේ දර්ශන ද ඇති වේ, ඔබද එවැනි සුර ධූතයෝ බවට පත් වේ. ඉක්බිතිව ඔබ මෙහි එන්නේ, සත් යුගයේ දී මුළු ලොවම හිමිකරුවන් බවට පත් වෙමිනි. මෙම බ්‍රහ්මා විශ්ණු සිහි නොකරයි. මොහු ශිව බාබා සිහිකිරීමෙන් විශ්ණු බවට පත් වේ. ඒ නිසා, ඔබ මේවා තේරුම් ගත යුතුයි. ඔවුන් කොහොමද ඔවුන්ගේ රජ දහන ලැබුවේ? එහිදී, යුද්ධ ආදිය නොමැත. දෙවි දේවතාවුන් ප්‍රචණ්ඩ වන්නේ කෙසේද? කවුරු විශ්වාස කළත් නොකළත්, ඔබ දරුවන් දැන් පියා සිහි කර එම රජ දහන ලබා ගනී. ගීතාවේ ද මෙසේ කියැවේ ඕ දරුව, ශරීරයත් ශාරීරික ආගම්, සහ ශරීරයද අතහැර නිරතුරුවම මා පමණක් සිහි කරන්න! පරමාත්ම දෙවියන්ට ඇලී සිටීම සඳහා ශරීරයක් නැත. ඔහු මෙසේ කියයි මම මොහුගේ ශරීරය සුළු වේලාවකට ණයට ගනී. නෙළුසේව, ඥානය දෙන්නේ කෙසේද? මා බීජයයි. මට මුළු වෘක්ෂය ගැනම ඥානය ඇත. වෙන කිසිවෙකු මෙය නොදනී. ලෝකයේ කාල සීමාව කොපමණ වේද? එය ස්ථාපනය කරන්නේ, පවත්වා ගන්නේ හා විනාශ වන්නේ කෙලෙසද? මනුෂ්‍යයින් මේවා දත යුතුයි. අධ්‍යයනයන් කරන්නේ මනුෂ්‍යයන්ය. සතුන් ඉගෙන ගන්නේ නැත. අනිත් මිනිසුන් හදාරන්නේ, සීමිත අධ්‍යයනයකි. පරම පියා ඔබට උගන්වන්නේ, අසීමිත හිමිකරුවන් බවට ඔබ පත් කරවන අසීමිත අධ්‍යයනයයි. ඒ නිසා, ඔබ විස්තර කර දිය යුතුයි කිසිම මනුෂ්‍යයෙකුට හෝ ශරීරයක් ඇති කෙනෙකුට පරමාත්ම දෙවියන් යැයි කිව නොහැකිය. බ්‍රහ්මා, විශ්ණු සහ ශංකර්ට ඇත්තේ සූක්ෂම ශරීර වෙයි. ඔවුන්ගේ නම් සම්පූර්ණයෙන් වෙනස්ය. ඔවුන්ට දෙවියන් යැයි කිව නොහැක. මේ ශරීරය මේ දාදාගේ ජීවාත්ම සත්තාවේ සිහසුනයි. අමරණීය වූ සිහසුන ඇත. උසස් මිනිසුන් එහි ගොස් එම සිහසුනේ වාඩි වේ. පරම පියා දැන් ඔබට විස්තර කරයි. මේ සියලු ශරීර අමරණීය ජීවාත්ම සත්තාවන්ගේ සිහසුන් වේ. ජීවාත්ම සත්තාව අමරණීව වන අතර එය මරණයෙන් විනාශ නොවේ. කොහොමනමුත්, සිහසුන වෙනස් වෙමින් යයි. මේ අමරණීය ප්‍රතිමාව එනම්, ජීවාත්ම සත්තාව මේ සිහසුනේ වාඩිගනී. මුලින්, සිහසුන කුඩා වන අතර ඉන්පසු වර්ධනය වේ. ජීවාත්ම සත්තාව එක ශරීරයක් හලා දමා තව එකක් ගනී. ජීවාත්ම සත්තාව අමරණීය වන නමුත්, සංස්කාර හොඳ හා නරක වශයෙන් ඇති නිසා මෙසේ කියැවේ එනම්, ඒ කර්ම ඵලයයි. ජීවාත්ම සත්තාවන් කෙදිනකවත් විනාශ නොවේ. ඇත්තේ ජීවාත්මයන්ගේ එකම පියා පමණි. ඔබ මෙය තේරුම් ගත යුතුයි. මේ බාබා ඔබට ආගමික ලේඛණ වලින් කරුණු කියනවාද? කිසිවෙකුට ආගමික ලේඛණ හදාරා ආපසු ගෙදර යා නොහැකිය. හැම කෙනෙක්ම අවසානයේ දී මී මැසි කැලක් සේ නැවත ගෙදර යයි. රජ මැස්සියක්ද ඇත. සියල්ලෝ ඇ පසුපස යයි. පරමාත්ම පියා ආපසු යන විට සියලු ජීවාත්ම සත්තාවන් ඔහු පසු පස යයි. උත්තරීතර කලාපයේ සියලු ජීවාත්ම සත්තාවන් මී වදයක ආකාරයෙන් සිටින අතර මෙහි ඇත්තේ මිනිසුන් සමූහ වශයෙනි. මේ රංචුව ද කවදා හෝ නැවත ගෙදර යා යුතුය. පරම පියා පැමිණ සියලු ජීවාත්ම සත්තාවන් ගෙදර කැඳවාගෙන යයි. ''ශිව පෙරහැර'' සිහියට නැගේ. ඔබට දරුවන් හෝ මනාලියන් යැයි කිව හැකිය. පියා පැමිණ ඔබ දරුවන්ට අධ්‍යාපනය දෙමින් ස්මෘති වන්දනාව උගන්වයි. ජීවාත්ම සත්තාවකට පාරිශුද්ධියට පත් නොවී ගෙදර යා නොහැකිය. ඔබ පාරිශුද්ධියට පත් වූ කල, පළමුවෙන් යන්නේ සාම දේශයටයි. ඔබ සියලු දෙනා එහි ගොස් නවතී. ඉන්පසු ටිකෙන් ටික එහි සිට පැමිණ මෙහි සංඛ්‍යාව වැඩි වේ. පළමුව ඔබ පියා පසුපස දුවයි. ඔබ එක්කෝ පියා පසුපස යමින් යෝගා වෙයි, නැත්නම් මනමාලයා සමඟ යෝගා වෙයි. රජදහනක් නිමැවිය යුතුයි. ඔබ සැවොම එකවර පහළට නොඑයි. එහි ඇත්තේ ජීවාත්ම සත්තා ලෝකයයි. ඔබ ටිකෙන් ටික අනුපිළිවලින් පහළට ආ විට වෘක්ෂය හෙමින් වැඩේ. පළමුව පරමාත්ම පියා විසින් ස්ථාපනය කරන ආදි සනාතන දේවි දේවතා ධර්මය ඇත. ඔහු පළමුව අපව බ්‍රහ්මිණ්වරු කරවයි. ඔහු ප්‍රජාපිතා බ්‍රහ්මාය. ඔහුගේ මිනිසුන් වශයෙන් ගත්කල සොයුරන් හා සොයුරියන්ය. බොහෝ බ්‍රහ්ම කුමාරවරු සහ කුමාරිවරියන් ඇත. නියතයෙන්ම ඔවුන්ගේ බුද්ධියේ ශ්‍රද්ධා විශ්වාසය ඇති නිසා ඔවුන් බොහෝ වෙයි. බ්‍රහ්මිණ්වරු කොපමණ සිටිනවා ද? බොහෝ ශක්තිමත් සහ දුර්වල? සමහරු 90% ක් ලකුණු ලබා ගන්නා අතර අන් අය ලබන්නේ 10% පමණි. එයින් පෙනෙන්නේ ඔවුන් දුර්වල බවයි. ඔබ අතරින් ද, ශක්තිමත් අය නියතයෙන්ම මුලින් එන අතර දුර්වල අය පැමිණෙන්නේ අවසානයේ දීය. මෙය නළුවන්ගේ ලෝකය වන අතර එය දිගටම කරකැවේ - සත් යුගය, ත්‍රේත යුගය. දැන් මෙහි ඇත්තේ ඉතා උසස් සංගම් යුගයයි. පරමාත්ම පියා දැන් මෙය අපට විස්තර

කරයි. කලින්, ඔබ මෙය වැරදියට තේරුම් ගෙන චක්‍රයේ කාලය අවුරුදු සිය දහස් ගණනක් යැයි සිතුවා. පරම පියා දැන් අපට විස්තර කර දී තිබෙනවා සම්පූර්ණ චක්‍රය අවුරුදු 5000 ක් බව. කල්ප භාගයකට රාම රාජ්‍යය වන අතර කල්ප භාගයක් ඇත්තේ රාවණ් රාජ්‍යයයි. චක්‍රය අවුරුදු සිය දහස් ගණන් වුණා නම්, එසේ භාගය භාගය නොවේ. සැපත් දුකත් ලෝකය තුළ නියමිතය. අපි මේ අසීමිත ඥානය අසීමිත පියාගෙන් ලබා ගනී. ශිව බාබාට ශාරීරික නමක් නැත. මේ ශරීරය අයිති දාදාටයි. බාබා කොහිද? බාබා මෙම ශරීරය ණයට ගෙන සිටින්නේ කෙටි කාලයකටයි. බාබා කියන්නේ මට මුඛයක් අවශ්‍යයි කියාය. මෙහි අබු වලද ගව මුඛ (එළදෙනාගේ කට) නිර්මාණය කර ඇත. කඳු සෑම තැනින් ජලය ගලා එයි. ඔවුන්ට හමු වුණා වතුර ගලා එන එළදෙනකගේ මුවක්. ඔවුන් එය සැලකුවේ ගංගා නම් ගඟේ ජලය කියාය. කොහොමද ගංගා නම් ගඟ මෙහි එන්නේ? ඒ සියල්ල බොරු කතාය. මෙසේ කියැවේ මායා මිත්‍යාවකි. ලෝකයද මිත්‍යාවකි. භාරතය දෙව්ලොව ලෙස තිබෙන විට එයට සත්‍යයේ දේශය යැයි කියූ අතර වියපත් වූ කළ එයට අසත්‍යයේ දේශය යැයි හැඳින්වේ. මෙම අසත්‍ය දේශයේ සියලු දෙනා අපිරිසිඳු වූ කළ ඔවුන් කෑගසා හඬගායි. බාබා, අපව පාරිශුද්ධියට පත් කර මෙම ජරාජීර්ණ ලෝකයෙන් ගෙන යන්න! පරම පියා මෙසේ කියයි කාම රාගය නම් වූ සෑයේ වාඩි වීම නිසා මගේ සියලු දරුවන් විරූපී විය. පියා මෙහි සිට ඔබ දරුවන්ට මෙසේ කියයි ඔබ දෙව්ලොව අයිතිකරුවන් වී සිටියා නේද? ඔබට මතකද? ඔබ දරුවන්ට ඔහු විස්තර කර දෙයි. ඔහු මුළු ලොවටම විස්තර නොකරයි. ඔහු ඔබට පමණක් කියා දෙන නිසා ඔබ පියා හඳුනා ගනී. මේ ලෝකයට කියන්නේ කටු අකුලක් කියාය. ඔබට අනින ලොකුම කටුව කාමරාගයයි. මෙහි බොහෝ භක්තිවන්තයින් එළවළු කෑමම කෑවත් ඔවුන් පාපයෙන් මිදී නොසිටියි. උපන් දා සිටම බ්‍රහ්මචර්ය වන අය ඇත. ඔවුන් කුඩා කළ සිටම අපිරිසිඳු ආහාරද ගෙන නැත. සන්‍යාසීන් ද මෙසේ කියයි පාපයෙන් තොර වන්න! ඔවුන් මිනිසුන් උනන්දු කරවන්නේ සීමිත අතහැරීමටයි. ඔවුන් ඊළඟ උපතේ දීත් ගෙදර හා පවුල අතහැර පිටවී යයි. ක්‍රිෂ්ණා වැනි දෙවි දේවතාවුන් ගෙවල් හා පවුල් අතහැර යනවාද? නැත! ඔබේ අතහැරීම අසීමිත අතර ඔවුන්ගේ එය සීමිතය. ඔබ ඔබේ නෑදෑයින් ආදී සියලු දේ, මුළු ලොවම අත හරී. ඒ සඳහා දැන් දෙව්ලොව නිමවෙමින් පවතී. ඔබේ බුද්ධිය යා යුත්තේ දෙව්ලොව දෙසට පමණි. ඒ නිසා ඔබ ශිව බාබා සිහිකළ යුතුමයි. අසීමිත පියා මෙසේ කියයි ''මාව සිහිකරන්න! මන්මනභාව්! මධ්‍යාජීභාව්!'' ඒ මගින් ඔබ දෙවි දේවතාවන් බවට පත් වේ. මෙය ගීතාවේ එම කතාන්තරයමයි. එය සංගම් යුගයද වෙයි. මා පැමිණ ඔබට මේ ඥානය ලබා දෙන්නේ සංගම් යුගයේ දී පමණි. මා ගිය කල්පයේ දීද සංගම් යුගයේ දී නියතයෙන්ම ඔබට රාජයෝගා ඉගැන්වූවා. මෙම ලෝකය වෙනස් වී ඔබ අපිරිසිඳු බවින් පිරිසිඳු බවට පත් වේ. දැන් මේ ඉතා උසස් සංගම් යුගය වූ කලී අප තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් බවට පත් වන කාලයයි. සියල්ල ඉතා පැහැදිලිව තේරුම් ගෙන අචල ශ්‍රද්ධාවෙන් යුතුවන්න. මෙය කියා දෙන්නේ මනුෂ්‍යයෙක් නොවේ. මේ පරමාත්ම දෙවියන්ගේ ඉහළම ඉතාම ඉහළ උපදෙස් වන ශ්‍රීමත්ය. අන් සියල්ල මනුෂ්‍යයින් කියන දේය. මනුෂ්‍යයින් කියන දේ ඇසීමෙන් ඔබ පහළටම වැටෙමින් ආවා. දැන්, ශ්‍රීමත් අනුගමනයෙන් ඔබ ඉහළට එසැවේ. පරම පියා ඔබව මනුෂ්‍ය බවින් දේවත්වයට ගෙනයයි. පරමාත්ම දෙවියන්ගේ කතා දිව්‍යලෝකයේ කතා වන අතර අනෙකුත් කතා අපායේ අයගේ කතාය. ඒවාට රාවණ්ගේ කතා යැයිද සඳහන් වේ. රාවණ් රාජ්‍යය ද පොඩි නැත. දැන් මුළු ලොවම රාවණ්ගේ රාජ්‍යයයි. මේ අසීමිත දිවයින (ලංකාව) රාවණ් රාජ්‍යයෙන් වැසී ඇත. එවිට එය දෙවි දේවතාවන්ගේ පිරිසිඳු රජ දහන බවට පත් වේ. එහි, බොහෝ සතුට ඇත. දෙව්ලොව ගැන විස්තර පැසසුම් බොහෝ ඇත! ඔවුන් ''අහවලා දිවංගත වුණා'' යැයි ද කියයි. ඒ නිසා, ඔහු සිට ඇත්තේ ම අපාය තුළයි. ඔහු අපායෙන් පිටත් වූවා නම්, නැවත පැමිණෙන්නේ අපායටමයි. මේ මොහොතේ දෙව්ලොව නොතිබේ. මේවා කිසිඳු ආගමික ලේඛණයක සඳහන් ව නැත. පරම පියා දැන් මේ සියලු ඥානය ඔබට ලබා දී ඔබේ බැටරිය බලගන්වයි. එවිට මායා සම්බන්ධය කඩයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබේ සිතිවිලි, වචන හා ක්‍රියා පාරිශුද්ධ බවට පත් කරගෙන ජීවාත්ම සත්ථාවේ බැටරිය බලගන්වා ගන්න. ස්ථිරසාර බ්‍රහ්මිණ් කෙනෙක් බවට පත් වන්න.

2. ඔබේ මන්මත් අනුව ක්‍රියා නොකර අන් අයගේ පරමත් ද අත්හරින්න. එකම පරම පියාගේ උපදෙස් පිළිපැද ඔබේ උසස් බව ඇති කර ගන්න. සතෝප්‍රධාන් බවට පත් වී පරමාත්ම පියා සමඟ ගෙදරට ඉගිල යන්න.

**වරදානය:** ඔබ මාස්ටර් නීති සම්පාදකයෙකු වී ඔබගේ සත්‍ය බලයෙන් පදාර්ථය සහ ලෝකය සතෝප්‍රධාන් කරත්වා.
ඔය දරුවන් සත්‍යයේ බලය උකහා ගෙන මාස්ටර් නීති සම්පාදකයින් වන විට, පදාර්ථය සතෝප්‍රධාන් වන අතර මෙම යුගය ස්වර්ණමය යුගය බවට පත් වේ. සියලුම ජීවාත්ම ඔවුන්ගේ මුක්තියේ වාසනාව නිර්මාණය කරයි. ඔබේ සත්‍යය ඇල්කෙමිස්ට් ගලක් වැනිය. ඇල්කෙමිස්ට් ගල යකඩ රන් බවට පත් කරනවා සේම, සත්‍යයේ බලය ජීවාත්ම, පදාර්ථය, කාලය, සැම සබඳතා වලම සියලුම දේවල්, සංස්කාර, අන්තර් ක්‍රියා සහ ආහාර සතෝප්‍රධාන් කරවයි.

**පාඨය:** යෝගී ජීවාත්ම යනු කිසිදු පදාර්ථ කැලඹීමකින් ඇදී නොයන අයයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

ස්වදර්ශන චක්‍රධාරී බවට පත් වී වියන යට සිටින අයෙකු වන්න. එවිට, ඔබ ශරීරය පිළිබඳ අවධානය, නාස්තිකාර සිතිවිලි, ලෞකික සහ අලෞකික සබඳතා, බොහෝ උපත් වල ස්වභාවය සහ සංස්කාර සහ පදාර්ථයේ විවිධ ආකර්ෂණයන් යන බොහෝ ආකාරයේ භ්‍රමණයන්ගෙන් නිදහස් වන අතර පියාගෙන් ඔබට ලැබී ඇති බල භාවිතා කරමින්, ඔබට පහසුවෙන්ම බොහෝ ජීවාත්මයන් සියලු ආකාරයේ භ්‍රමණයන්ගෙන් නිදහස් කරවා ඔවුන්ව ජීවන මුක්තිය ලද්දන් බවට පත් කළ හැකි වනු ඇත.